**හානිපූර්ණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස වන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සිවිල් සමාජයේ මතය.**

පහත අත්සන් තබා ඇති ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ කණ්ඩායම් වන අප 2018 ජූනි මස 25 වන දින ගැසට් කරන ලද හානිපූර්ණය සඳහාවන කාර්යාලය පිළිබඳ පනත් කෙටුම්පතෙහි එන ඇතැම් විධිවිධානයන්හි ඌනතා සම්බන්ධයෙන් බලවත්සේ අවධානයෙන් පසුවන්නෙමු. යටකී කෙටුම්පත සම්පාදනය වීමේ ක්‍රියාවලිය සහ එහි අන්තර්ගතය පිළිබඳ මතභේදාත්මක යැයි හැඟෙන කරුණු කිහිපයක්ම සම්බන්ධයෙන් පහත අත්සන් තබා ඇති ක්‍රියාකාරීන් සහ කණ්ඩායම්හි සැලකිල්ල යොමුව ඇත. ඒ අතරිනුදු පනත් කෙටුම්පතෙන් පිහිටුවීමට යෝජිත කාර්යාලයෙහි බලතල සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වන බරපතල ආකාරයේ ගැටලු දෙකක් සම්බන්ධයෙන් අපගේ විශේෂ අවධානය යොමුව ඇති බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත. යථෝක්ත ගැටලු මෙම අවස්ථාවේදීම ආමන්ත්‍රණය නොකළහොත් යෝජිත ක්‍රියාවලිය සමග ඉදිරියේදී සම්බන්ධව කටයුතුකිරීම එතරම් ඵලදායී එකක් නොවනු ඇත. එසේ හෙයින් සිවිල් සමාජය විසින් පහත හඳුනාගනු ලබන ගැටලු නිවැරදිකිරීම සඳහා කෙටුම්පතට සුදුසු සංශෝධන එක් කරන ලෙස අප මෙනයින් ඉල්ලා සිටින්නෙමු. කෙටුම්පතෙහි අන්තර්ගතය හා ඒහා බැඳී ඇති සෙසු ගැටලු සම්බන්ධයෙන් සිය අදහස් ඉදිරිපත්කිරීමට සිවිල් සමාජයට සහ අදාළ සෙසු පාර්ශවයන් හට ඉඩ සලසන ප්‍රයෝජනවත් සාකච්ඡාවන්හි නිරතවීමකින් තොරව යථෝක්ත පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම කිසිසේත් යෝග්‍ය නොවන බවද අප මෙහිලා අවධාරණය කර සිටින්නෙමු.

යෝජිත කෙටුම්පතෙහි පවතින ප්‍රධාන පෙළේ ඌනතා වශයෙන් පහත කාරණා අප විසින් ඉදිරිපත් කරන්නෙමු.

01) හානිපූර්ණය සම්බන්ධයෙන් අදාළ වන්නාවූ ප්‍රතිපත්ති සහ නිර්ණායක සම්බන්ධයෙන් තීරණාත්මක භූමිකාවක් ඉටුකිරීමේ හැකියාව යෝජිත කාර්යාලය වෙත පැවරීමට යථෝක්ත පනත් කෙටුම්පත අසමත්ව ඇත. කෙටුම්පතෙහි විධිවිධානවලින් පැහැදිලිව පෙන්වා සිටින පරිදි හානිපූර්ණය සඳහා වන කාර්යාලය විසින් ගෙන එන ප්‍රතිපත්ති සහ නිර්ණායක ක්‍රියාත්මක තත්ත්වයට පත්වනුයේ හුදෙක් ඒ සඳහා අමාත්‍යය මණ්ඩලයේ අනුමැතිය ලැබීම හරහා පමණි (වගන්ති අංක 11(1)(උ)). හානිපූර්ණය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සහ නිර්ණායකයන්හි අවසාන තීරකයා බවට අමාත්‍ය මණ්ඩලය පත්කරන මෙකී අනවශ්‍ය විධිවිධානය සම්පූර්ණයෙන්ම ගැටලුකාරීය. ඒ හරහා කැබිනට් මණ්ඩලය අතින් ඉහතකී ප්‍රතිපත්ති සහ නිර්ණායක සම්මතවීමේ කාර්යය අනවශ්‍ය ප්‍රමාදයකට ලක්කිරීමේ අවදානම ඇතකරනවා මෙන්ම එවැනි ප්‍රතිපත්ති ආදිය අනුමතකිරීම ප්‍රතික්ෂේපකිරීමේ බලය කැබිනට් මණ්ඩලයට ලබාදීමක් ද ඒ හරහා සිදුවේ. අතීතයේ මෙවැනි ඇතැම් අවස්ථාවන්හි සිදුව ඇති ආකාරයට යටකී ප්‍රතිපත්ති සහ නිර්ණායක ආදිය අනුමතකිරීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කරන ක්‍රියා පටිපාටිය එකී ප්‍රතිපත්තීන් සඳහා පාදකවන සැබෑ වටිනාකම් අහෝසි කරන දමන තරමේ ඒවා වීමට ද මෙහිලා ඉඩ ඇත.

02) එයට අමතරව හානිපූර්ණය සඳහා වන කාර්යාලය විසින් ගෙන එන ප්‍රතිපත්ති සහ නිර්ණායක අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකිරීමෙන් පසුව එකී ප්‍රතිපත්ති සහ නිර්ණායක මෙන්ම එකී ප්‍රතිපත්ති/නිර්ණායක ක්‍රියාත්මකකිරීම සඳහා ලබාදෙන සියලුම ආකාරයේ මුල්‍ය ප්‍රතිපාදන ද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුයැයි කෙටුම්පතෙහි යෝජනාවී ඇත (වගන්ති අංක 22(4)). හානිපූර්ණය සඳහා වන කාර්යාලය යෝජිතව තිබෙනුයේ එකී කාර්යාලයට පැවරෙන කාර්යභාරය ක්‍රියාත්මකකිරීම සඳහා එයටම වෙන්වූ අරමුදලක්ද සහිතවය. එවැනි තත්ත්වයක් තුළ කෙටුම්පතෙහි එන ඉහතකී විධිවිධානය අනවශ්‍ය සහ නිසි ප්‍රයෝජනයකින් තොර එකක් බවට පත්වේ. ඒ හරහා හුදෙක් යෝජිත කාර්යාලයේ ක්‍රියාකාරීත්වය තවත් අනවශ්‍ය වටයකින් පාර්ලිමේන්තුවේ ග්‍රහණයට ලක්කිරීමක් සිදුකෙරන අතර හානිපූර්ණය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සහ නිර්ණායකයන්හි හැඩරුව තීරණයකිරීමේ කාර්යය තුළ යෝජිත කාර්යාලයට ලබාදිය හැකි දායකත්වය තවදුරටත් හීන කර දැමීමක්ද එයින් සිදුවේ.

හානිපූර්ණය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සහ නිර්ණායක ක්‍රියාවට නැංවීමේ කාර්යය තුළ තීරණගැනීමේ හැකියාව යොජිත කාර්යාලයට මුලුමනින්ම අහිමි කරන කෙටුම්පතෙහි ඉහත දැක්වූ විධිවිධාන දෙක සම්පූර්ණයෙන්ම පාහේ ගැටලුකාරී බව මෙහිලා සඳහන් කළ යුතුය. එවැනි තත්ත්වයක් තුළ යෝජිත කාර්යාලය හානිපූර්ණය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තීන් තීරණයකිරීමේ කාර්යය තුළ නිලධාරීවාදයට යටවන තවත් එක් ආයතනයක් පමණක් බවට පත්වනු ඇත. සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය තුළ හානිපූර්ණය සඳහා වන ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීමටත් කැපවූ ආයතනයක අවශ්‍යතාවය ඉටුකිරීම සඳහා යෝජනා වන ආයතනයක් වන මුත් හානිපූර්ණය සඳහා වන කාර්යාලය ඉහත තත්ත්වය හරහා මුලුමනින්ම එහි අභිමථාර්ථයනට නොගැලපෙන එකක් බවට පත්වනු ඇත.

මිනිස් අයිතිවාසිකම් කඩවූවන්ගේ ජීවිත යළි ගොඩනැගීමේ උත්සාහය තුළ අතිශය වැදගත් තීරණාත්මක කාර්යයක් හානිපූර්ණය හරහා සිදුවේ. එවැනි තත්ත්වයක් තුළ හානිපූර්ණ ක්‍රියාවලිය ප්‍රයෝජනවත් සහ නිසි ආකාරයෙන් ස්ථාපිත වුවහොත් එය ශ්‍රී ලංකාව තුළ අතිශය සාධනීය වෙනස්කම් ඇතිකිරීමට අතිමහත් දායකත්වයක් ඇතිකරනු ඇත. එතෙකුදු වුව, හානිපූර්ණ ක්‍රියාවලියෙන් බලාපොරොත්තුවන සංක්‍රාන්ති යුක්තික අභිමථාර්ථයන් ඉටු කරගැනීමට නම් එය වේගවත්, කාර්යක්ෂම, සහ අදාළ සියලු පාර්ශවයන්හි සහභාගීත්වයෙන් ගොඩනැගෙන්නක් විය යුතුවාක් මෙන්ම එකී ක්‍රියාවලිය මුලුමනින්ම විනිවිදභාවයෙන් යුතුව ඉදිරියට යාමද අවශ්‍යයෙන්ම සිදුවිය යුතුය. ඒ සඳහා දේශපාලන බලපෑමෙන් නිදහස්, හානිපූර්ණය සඳහා සුදුසු ප්‍රතිපත්ති හා නිර්ණායක තීරණය කර ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නිසි බලය සහිත ස්වාධීන කාර්යාලයක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයකි. මෙකී සියලු කාරණා සැලකිල්ලට ගනිමින් සංහිඳියාව සඳහා ප්‍රවිචාරණ කාර්යසාධන බලකායෙහි නිර්දේශ පාදක කරගනිමින් ශ්‍රී ලංකාවේ සිටින වින්දිතයන්ගේ පාර්ශවවල අවශ්‍යතාවයන් නිසි පරිදි ආමන්ත්‍රණය කරන නෛතික යාන්ත්‍රණයන් ක්‍රියාවට නංවන ලෙසත් ඒ හරහා සංහිඳියාව ඇතිකිරීම පිණිස 2015 දී තමන් විසින් ලබාදුන් ප්‍රතිඥාවන් ඉටුකිරීම පිණිස කැපවෙන ලෙස අප ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නෙමු.